# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2035/10 - 2017 සැප්තැම්බර් මස 04 වැනි සඳුදා - 2017.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය :* IR/22/10/2010.

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2012.09.14 දිනැති හා අංක 1775/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2012.09.06 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ගම්පොල, කුරුඳුවත්ත කඩවීදිය, කැන්දගොල්ල, ගල්පාය හි පදිංචි එම්. ජී. පී. ජයලත් මයා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.06.05 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩබලන)

2017 අගෝස්තු මස 21 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**කාර්මික අධිකරණයේදී**

එම්. ජී. පී. ජයලත් මයා,
ගල්පාය, කැන්දගොල්ල,
කුරුඳුවත්ත කඩවීදිය,
ගම්පොල.

*නඩු අංක :* ඒ-3474

*ඉල්ලුම්කරු*

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුල පාර,
කොළඹ 05.

*වග උත්තරකරු*

යන දෙපාර්ශ්වය අතර පැවති කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානයයි

කම්කරු හා කම්කරු සබඳතා ගරු අමාත්‍ය ගාමිණි ලොකුගේ මහතා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 [1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා] දරන පනත් වලින් සංශෝධිත වූ

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා 2012.09.06 වන දින පත්කොට ඇත.

''ඉහත දෙපාර්ශවය අතර පැවති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වූයේ "ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ගම්පොල ඩිපෝවේ රියදුරෙකු වශයෙන් සේවය කරමින් සිටිය දී සිදුවූ රිය අනතුරක් සම්බන්ධයෙන් නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ විනය නිලධාරීගේ 2008.11.21 දිනැති විනය නියෝගය හා 2009.01.21 දිනැති එහි අභියාචනා මණ්ඩල සභාපතිගේ අභියාචනා නියෝගය මගින් එම්. ජී. පී. ජයලත් මහතා වෙත පමුණුවන ලද දඬුවම් යුක්තිසහගත ද යන්න හා යුක්ති සහගත නොවන්නේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

පූර්වෝක්ත යොමුව සම්බන්ධයෙන් 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනතේ 39 වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද නියෝග යටතේ 1961.10.27 දිනැති අංක 12731 දරන *ගැසට් පත්‍රයට* අනුකූලව එහි 30 වන වගන්තිය කෙරේ අවධානය යොමු කරවමින් පාර්ශවයන් අතර පවත්නා ආරවුල සම්බන්ධව සමථයකින් විසඳීමට ගන්නා ලද සියලු ප්‍රයත්න අසාර්ථක වීමෙන් අනතුරුව යොමුවේ සඳහන් කරුණ විභාගයට ගැනීමට තීරණය කළෙමි.

පළමු පාර්ශවයේ සහ වගඋත්තරකාර පාර්ශවයන් අතර හේතු විස්තර ප්‍රකාශ හා පිළිතුරු ප්‍රකාශ හුවමාරු කර ගැනීමට දෙපාර්ශවයට ඉඩ ලබා දෙන ලදී. ඉල්ලුම්කාර එම්. ජී. පී. ජයලත් මහතා වෙනුවෙන් නියෝජිත ඒ. එම්. ටී. බී. අබේසිංහ මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් රජයේ නීතිඥ රසික මල්ලවආරච්චි මහතා ද පෙනී සිටියහ.

වගඋත්තරකරුගේ දින රහිත එහෙත් කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරී වෙත 2012.11.07 යන දින මුද්‍රාවෙන් ලැබී ඇති පිළිතුරු ප්‍රකාශය පරිදි ඉල්ලුම්කරුට සිය සේවය අවසන් කිරීමේ පදනම මත සහන ඉල්ලිය හැක්කේ කම්කරු විනිශ්චය සභාවෙන් පමණක් හෙයින් කාර්මික අධිකරණයට ඉල්ලුම්කරුගේ ප්‍රශ්නය විසඳීමට අධිකරණ බලය නොපවත්වන බවටත් මූලික විරෝධතාවක් නගා තිබිණි.

ඉහත කී මූලික විරෝධතාවයට හානියක් නොවන පරිදි අගති රහිතව තවදුරටත් කම්කරු කොමසාරිස්තුමාගේ යොමු කිරීම සම්බන්ධවද කරුණු වගඋත්තරකාර දෙවන පාර්ශවය මගින් ඉදිරිපත් කරමින්,

වර්ෂ 2008.09.10 දින චෝදනා පත්‍රයක් මගින් ඉල්ලුම්කරු සිදු කරන ලද රිය අනතුරක් සම්බන්ධයෙන් වරදකරු බවට පත්කොට තීරණයක් ලබාදුන් බවත් ඒ කරුණ නිසාම සේවය තහනම් කර සිටි කාලයට අදාළ නොවන ලද වේතන අහිමි කරමින් වගඋත්තරකරු තීරණයක් ගෙන ඇති හෙයින් සේවයෙන් පහකළ බවත් කියා සිටියේ ය. එකී තීරණයට එරෙහිව ඉල්ලුම්කරු අභියාචනයක් වගඋත්තරකරු වෙත ඉදිරිපත් කළ ද එකී අභියාචනය ද නිෂ්ප්‍රභා කොට 2009.01.21 දින ඉල්ලුම්කරු වෙත දැන්වූ බව ද වගඋත්තරකරුගේ හේතු ප්‍රකාශයෙහි දක්වා ඇත.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථාව අනුව වරදකට ලක්ව ඇති ඉල්ලුම්කරු අභියාචනය මගින් ද ඔහුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කොට ඇති බැවින් ඉල්ලුම්කරුට සහන සැලසීමට නොහැකි බව වගඋත්තරකරු දී ඇති දණ්ඩන නියමයන් සාධාරණ හා යුක්තිසහගත බවත් කියා සිටිමින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලෙස වගඋත්තරකාර පාර්ශවය කියා සිටියේ ය.

2013.08.02 දින බේරුම්කරණ විනිශ්චය කාර්යට සහභාගී වූ ඉල්ලුම්කරුගේ නියෝජිත ඒ. එම්. ටී. බී. අබේසිංහ මහතා කරුණු දක්වමින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම විභාග කිරීමට අධිකරණ බලය බේරුම්කරණයට පවත්නා බවට හේතු පෙර අධිකරණ ක්‍රියාවලිය අනුව පවත්නා බවට තර්ක කළේ ය. එහෙත් ඉල්ලුම්කරුගේ වයස අවුරුදු 57 ඉක්මවා ගොස් ඇති බැවින් ඔහුට නැවත රැකියාව ලබා ගැනීමේ හැකියාව නැති හෙයින් වර්ෂ විසිපහකට අධික කාලයක් සේවය සපයා ඇති ඉල්ලුම්කරු විනය පරීක්ෂණයක ප්‍රතිඵලයක් ලෙස සේවය අවසන් කොට ඇති බවත් සේවය අවසන් කොට වර්ෂ පහක කාලයක් ඉකුත්ව ඇති බවත්, ඔහුගේ ආර්ථිකය හා පවුලේ රෝගී දරුවන් සහ භාර්යාවගේද දුක්ඛිත තත්වයද සානුකම්පිතව සලකා බලා කරුණාසහගත දීමනාවක් සමග ව්‍යවස්ථාපිත දීමනා වන අර්ථසාධක අරමුදල් හා සේවා භාරකාර අරමුදල් ද හැකි ඉක්මණින් ඉල්ලුම්කරු වෙත ලබා දීමට වගඋත්තරකාර ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සහාය පතන බවත් කියා සිටියේ ය.

ඊට පිළිතුරු ලබා දුන් රජයේ නීතිඥ මහතා, ඉල්ලුම්කරුගේ දියණියකගේ රෝගී තත්වය හා වෙනත් කරුණු ද සලකා බලා ඉල්ලුම්කරුට ලැබිය යුතු සියලු ව්‍යවස්ථාපිත දීමනා ඉක්මණින් ලබාගැනීමට තමන්ගේ සහාය වගඋත්තරකරු වෙත ලබා දෙන බවත් අවසාන වන්දි මුදල හෝ ව්‍යවස්ථාපිත දීමනා ලබා දීම ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වගකීමක් හෙයින් ඊට අවශ්‍ය පියවර ගන්නා ලෙස දැන්වීමට එකඟතාවය පළ කර සිටියේ ය.

2014.03.31 දින බේරුම්කරණ ක්‍රියාවලිය ආරම්භ කළ අවස්ථාවේදී ඉල්ලුම්කරු තමාට ලැබිය යුතු වන්දියක් හෝ කරුණා සහගත දීමනාවක් හෝ සමඟ අනෙකුත් සියළු ව්‍යවස්ථාපිත දීමනා ලබාගැනීමටත්, යථෝක්ත සියළුම දීමනා ඉල්ලුම්කරු වෙත ලබාදීමටත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීතිඥවරු එකඟතාවය පළ කිරීමෙන් අනතුරුව මෙම බේරුම්කරණයේ කටයුතු නිමාවට පත් කිරීම සඳහා දෙපාර්ශවයේ එකඟතාවය මත තීරණය කළෙමි.

ඒ අනුව ඉල්ලුම්කාර හා වගඋත්තරකාර යන දෙපාර්ශවයේ එකඟතාවය කෙරෙහි බේරුම්කාර මාගේ ද අනුමැතිය ලබා දී මෙම ප්‍රදානය කරන ලදී. මෙය සාධාරණ හා යුක්තිසහගත තීරණයක් බැව් සහතික කරමි.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණයේ
බේරුම්කාර මණ්ඩලයේ සාමාජික.

2017 ජුනි මස 05 වැනි දින.

09-442

මගේ අංක : IR/22/31/2011(II).

**කාර්මික ආරාවුල් පනත - 131 වැනි අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2016.03.15 දිනැති හා අංක 1958/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.03.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හලාවත, මුගුණුවටවන, තල්ගහවෙල, ''සාරානාත්'' අංක 20හි පදිංචි ඒ. ඩබ්. එන්. හරිස්චන්ද්‍ර වඩුගේ මහතා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.07.21 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල් (වැඩබලන)

2017 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**කාර්මික අධිකරණයේදී**

ඒ. ඩබ්. එන්. හරිස්චන්ද්‍ර වඩුගේ මයා,
අංක 20, ''සාරානාත් '',
තල්ගහවෙල, මුගුණුවටවන,
හලාවත.

*නඩු අංක :* ඒ-3633 *ඉල්ලුම්කරු*

*සහ*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුල පාර,
කොළඹ 05.

*වග උත්තරකරු*

යන දෙපාර්ශවය අතර ඇති කාර්මික ආරාවුල පිළිබඳ ප්‍රදානයයි

කම්කරු හා වෘත්තිය සමිති සබඳතා ගරු අමාත්‍ය වේලාතන්ත්‍රිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 [1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා] දරන පනත් වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් වර්ෂ 2016.03.10 වැනි දින පත්කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුල මෙසේ ය.

1. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ හලාවත ඩිපෝවේ සේවය කර දැනට පුත්තලම ඩිපෝවට ස්ථාන මාරු ලබා සේවය කරන ඒ. ඩබ්. එන්. හරිස්චන්ද්‍ර වඩුගේ මහතාට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණය හේතුවෙන් වැඩ තහනම් කර සිටි 2010.10.28 දින සිට 2011.01.17 දින දක්වා කාලයට අදාලව හිඟ වැටුප් ලැබීමට හිමිකම් තිබේද යන්න හා එලෙස හිමිකම් තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් මොනවාද යන්න,

සහ

2. ඒ. ඩබ්. එන්. හරිස්චන්ද්‍ර වඩුගේ මහතාට එරෙහිව පවත්වන ලද විනය පරීක්ෂණය මගින් ලබා ද ඇති දඬුවම් හේතුවෙන් යම් අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න හා එලෙස ආසාධාරණයක් සිදුවී ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

උක්ත යොමුව සම්බන්ධව විභාගයේ දී ඉල්ලුම්කරු තමාම පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ නීති නිලධාරී තුමිය පෙනී සිටියා ය.

ආරම්භයේදීම සමථයක් පවතිදැයි දෙපක්ෂයෙන් විමසන ලදුව ඒ සඳහා ඉඩක් ඇති බවට දෙපක්ෂයම ප්‍රකාශ කළෙන් ඒ සඳහා වෙනත් දිනක් වෙන් කරන ලදී.

2017.03.02 දින නඩුව කැඳවූ අතර වගඋත්තරකාර පාර්ශවයේ නීතිඥ මහත්මිය මෙම බේරුම්කරණ විභාගය සමාදානයෙන් අවසන් කිරීමට ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවය මත, ඉල්ලුම්කරු 2016 දි විශ්‍රාම ගන්නා ලද අවස්ථාවේ අවසාන වැටුප පරිදි මාස 2 දින 19 සඳහා වැටුප් ගෙවීමට එකඟතාවය ලැබී ඇති බවත්, එකී මුදල ලබාගෙන සමථය සඳහා ඉල්ලුම්කරු ද මනාපය පළ කරන ලද්දෙන් ඒ සඳහා ඉඩ ලබා දෙන ලදී.

පූර්වෝක්ත කරුණු මත 2017.03.10 දිනැති රු. 1,08,298.46 වටිනා අංක 217293 දරන මහජන බැංකු චෙක්පත 2017.03.10 දින ඉල්ලුම්කරු භාරගැනීමෙන් හා වගඋත්තරකරු වෙනුවෙන් නීති නිලධාරී තුමිය භාරදීමෙන් මෙම බේරුම්කරණ නඩුව අවසානාත්මක ලෙස නිමාවට පත්වීම සිදුවිය.

මෙම තීරණය සාධාරණ හා යුක්තිසහගත බැව් සහතික කරමි.

එස්. කාරියවසම්,
බේරුම්කාර මණ්ඩලයේ සාමාජික.

2017 ජූලි මස 21 වැනි දින.

09-443

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.